# තාප්ප මත ලියූ අකුරු ඇත. ඒවා රතු පාටය

## ඝාතනයට ලක්වූ තාරකී අවසන් කාලයේ මෙසේ ද ලිව්වේය



**වාර්ගික දේශපාලනය තුළ පමණක් ජනතාවට පැවතිය නොහැකිය. මුදල් හම්බ කිරීමට දේශපාලනය කරන දේශපාලඥයන්, අත ගැසීමටවත් නොදන්නා උග්‍ර සමාජ ප්‍රශ්න මෙහි පවතී. වහාබි මූලධර්මවාදය හෝ සුෆි මිත්‍යාදෘෂ්ටිය පිළිබඳ කෙස් පැළෙන තර්කවලට වඩා තමන්ගේ වී අස්වනුවලට යහපත් මිලක් ලබා ගැනීමට ගොවීහු උනන්දු වෙති.**

ලේකම්වරයා මා සමඟ පැවසුවේ මඩකලපු දිස්ත්‍රික්කයේ සුනාමි සහන හා ප්‍රතිසංස්කරණ කටයුතු සොයා බැලීමට ජවිපෙ විසින් මන්ත්‍රීවරයකු පත් කර ඇති බවයි. ඉතා ඉක්මණින්ම මෙහි දෙමළ ජනතාව සමඟ සම්බන්ධතා පැවැත්වීමට ඔවුන් කටයුතු කරන බව මට විශ්වාසය.

වාර්ගික දේශපාලනය තුළ පමණක් ජනතාවට පැවතිය නොහැකිය. මුදල් හම්බ කිරීමට දේශපාලනය කරන දේශපාලඥයන්, අත ගැසීමටවත් නොදන්නා උග්‍ර සමාජ ප්‍රශ්න මෙහි පවතී. වහාබි මූලධර්මවාදය හෝ සුෆි මිත්‍යාදෘෂ්ටිය පිළිබඳ කෙස් පැළෙන තර්කවලට වඩා තමන්ගේ වී අස්වනුවලට යහපත් මිලක් ලබා ගැනීමට ගොවීහු උනන්දු වෙති. සමාජ විමුක්තිය පිළිබඳ ජවිපෙ පණිවිඩය දිළිඳු හා කොන් කරන ලද සමාජ පන්තිවලට බලපෑම් සහගත වී තිබේ. ඔවුන්ගේ පක්ෂය යමක් කරමින් සිටී. එය දූෂිත නැත. අශුභවාදයක් සාමාජිකත්වය තුළ නැත. ජවිපෙ මන්ත්‍රීවරු ධනවත් මැරයෝ නොවෙති. එහි නායකයෝ සාමාන්‍ය පිරිමි හා ගැහැනුය. මඟ තොට දී හමුවන මිනිසුන්ගේ හැඟීම් ඔවුනට වටහා ගත හැකිය.

නිවැරැදි දේශපාලන තේරීම ජවිපෙ බව කල්පනා කරන ජන සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. ජවිපෙ වෙත ජනතා සහය අහිමි වෙමින් තිබෙන බවට හාන්සිපුටු පණ්ඩිතයන්ට හා සිහින දකින චින්තකයන්ට කොළඹ සිට දහසක් දේ කිව හැකිය. නැගෙනහිර දී වතුකරයේ දී හා දකුණේ බොහෝ ප්‍රදේශවල ඔවුන්ගේ වර්ධනයක් මම පැහැදිළිවම දකිමි. වතුකරයේ ජනතාව කපටි කවදාවත් නිවැරදි නොවන දේශපාලන හා වෘත්තීය සමිති නායකයන්ගෙන් ගලවා ගැනීම සඳහා තමන් ජවිපෙ හා එකතුවිය යුතු බව විශ්වාස කරන මධ්‍යම පළාතේ දෙමළ තරුණයන් බොහෝ දෙනෙකු සිටින බව මම දකිමි. දෙමළ හා මුස්ලිම් ජනතාව වෙත බලය බෙදා හැරීමට සපුරාම විරුද්ධ වන ජවිපෙ එම ජනතාවන් අතරම තම බලපෑම ව්‍යාප්ත කිරීමට තරම් ශූර වී තිබෙන්නේ කෙසේද? අවම තරමින් ඔවුන් ජවිපෙ වෙත ප්‍රතිචාර දක්වන්නේ ඇයි?

ජවිපෙ, ජනාධිපතිනී චන්ද්‍රිකා කුමාරතුංග කොටි සංවිධානය සමඟ සාම ගනුදෙනුවකට යාම වැළැක්වීමට ඇපකැප වී සිටින පක්ෂයක් බව ඇත්තකි. එසේ කළහොත් එක්සත් ජනතා නිදහස් සන්ධානය ගොඩනැඟීමෙන් පසුව දියවී යමින් සිටින ඇගේ පක්ෂය ඉන් මුදා ගැනීමට ඇය සමත් වන බව ඔවුහු දනිති. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැවත පියවි තත්වයට පත් නොවන තුරු තම ග්‍රහණය ගැනීමට ඔවුන්ට අවශ්‍ය බව අපි දනිමු. චන්ද්‍රිකා කොටි සංවිධානය සමඟ සාමයක් ඇති කර ගැනීම වැළැක්වීම මඟින් ජවිපෙ වාසි ලබා ගනී.

මෙහි දී සැලකිය යුතු කරුණ නම් ෆෙඩරල් විසඳුමක් සඳහා ජවිපෙ උග්‍ර විරෝධය යනු උපක්‍රමික මෙවලමක් පමණක් නොවන බවයි. එය ඔවුන්ගේ දේශපාලන දර්ශනය තුළ තදින් මුල් බැසගත් දෙයකි. එය පැන නඟින්නේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා සමාජය පිළිබඳව 1986 අප්‍රේල් 15 දින රෝහණ විජේවීර විසින් ජවිපෙ මධ්‍යම කමිටුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ අඩංගු අනම්‍ය මාක්ස් ලෙනින්වාදී අර්ථකතනය තුළිනි. ෆෙඩරල්වාදය වෙත ජවිපෙ දක්වන විරෝධය දකුණේ දී සාමාන්‍යයෙන් පවතින ආකාරයෙන් 'සිංහල ආධිපත්‍ය' ස්වරූපයක් වෙත ගමන් කරන්නේ නැත. නැගෙනහිර හා වතුකරයේ වෙසෙන මුස්ලිම් තරුණයන් ජවිපෙ වෙත ආකර්ෂණය වන්නේ මේ නිසාය. සමාජ අසාධාරණයට ගොදුරු වීම නිසා ඔවුහු ක්‍රම වෙනසකට ආසක්ත වෙති. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට සේවය කරන නිසා සමාජ ක්‍රමය සූරාකෑමෙන් යුතු බව ඔවුහු කල්පනා කරති. මාක්ස්, ලෙනින් හා විජේවීරගේ ඉගැන්වීම් පිළිබඳව වැඩිමනත් අවබෝධයක් ලබා ගන්නා විට ඔවුහු වැඩි වැඩියෙන් විශ්වාස කරන දෙයක් ඇත. එනම් ලංකාවේ වාර්ගික ගැටුම උත්සන්න කිරීම මඟින් තම නව යටත් විජිතකරණ සූරාකෑම මෙහි ව්‍යාප්ත කිරීමට ඇමෙරිකානු ප්‍රාග්ධනය කටයුතු කරන බවයි. ශ්‍රී ලංකාව 'ඇ-මෙරිකානු අධිරාජ්‍යවාදයේ වහල් කඳවුරක්' බවට පත්වීම වැළැක්වීමට නම් ජාතික ගැටලුව විසඳිය යුතු බව විජේවීර පැවසීය.

ඇමෙරිකානු අධිරාජ්‍යවාදයේ නායකත්වය සහිත ලෝක අධිරාජ්‍යවාදී කඳවුර ජාතික ප්‍රශ්නයෙන් පැන නැඟුණු අර්බුදය තම බලය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත කර ගැනීම උදෙසා උපයෝගී කරගෙන ඇත. ඔවුහු තම ග්‍රහණය ආර්ථික, දේශපාලන හා මිලිටරිමය වශයෙන් උත්සන්න කර තිබේ'

එසේම ශ්‍රී ලංකාවේ සියලු ජාතිකත්වයන් සමාන බව ජවිපෙ පවසයි. ශ්‍රී ලංකාවේ ජීවත් වෙන සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකත්වයන්ගෙන් කිසිවකට වැඩි වරප්‍රසාද ලබා නොදිය යුතු බවට ජවිපෙ හඳුනා ගනී. වසර ගණනාවක දිගු කාලයක් පුරා 'සමාජ උමඟ කෙළවර ආලෝකය' නොදුටු සමාජ අසාධාරණයෙන් කෙනෙහිලිකම්වලට ලක් වූ දෙමළ හා මුස්ලිම් තරුණයන්ගේ මනස තුළට මෙම පණිවුඩය කිඳා බසියි. 1986 දී විජේවීර ජවිපෙ මධ්‍යම කමිටුවට ඉදිරිපත් කළ වාර්තාව පක්ෂයේ වර්තමාන වැඩපිළිවෙළට පදනම සකස් කරයි.

'ජාතිකත්වයක් තවත් ජාතිකත්වයක් මත සහ කුලයක් තවත් කුලයක් මත බලපවත්වන සමාජ පීඩනය අහෝසි කෙරෙන අතර එවැනි දේ ආරක්ෂා කරනවුන්ට දඬුවම් කරනු ලැබේ' අද ජවිපෙ බයිබලය ලෙස සැලකෙන විජේවීරගේ වාර්තාව එසේ සඳහන් කරයි. ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රතිපත්තිමය රාමුව වන්නේ, ජාතිකත්ව අසමානතාව හා ජාතිකත්ව පීඩනය අහෝසි කර ජාතීන් අතර විශ්වාසයක අයිතිය පාගා දැමීම සඳහා තවත් ජාතිකත්වයකට විශේෂ වරප්‍රසාද ලබාදීම අහෝසි කිරීමත් වේ. අද පවතින ජාතික ප්‍රශ්නය විසඳීමට මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වුව සෑහේ. දෙමළ ජාතිකවාදී ධනපති පංතිය මීට එකඟ ද නැද්ද යන්න වැදගත් නැත.

'සිංහල හා මුස්ලිම් ජාතිකත්වයට එරෙහිව දෙමළ ජාතිකත්වය වෙත විශේෂ වරප්‍රසාද ඉල්ලන දෙමළ ජාතිකවාදී ධනපති පංතිය හා සුළු ධනේශ්වර පංතිය හෝ දෙමළ හා මුස්ලිම් ජාතිකත්වයට එරෙහිව සිංහල ජාතිකත්වය වෙත විශේෂ වරප්‍රසාද ඉල්ලන සිංහල ජාතිකවාදී ධනපති පංතිය හා සුළු ධනේශ්වර පංතිය එකඟ වූවත් නැතත් නිර්ධන පංතිය විසින් නිසැකව ම එය ක්‍රියාත්මක කරනු ඇත'

'ඉන් පසුව ජාතික අසමානතාව, ජාතිකත්ව පීඩනය හා ජාතික අවිශ්වාසය අහෝසි වනු ඇත. මෙය ළඟා කර ගත හැක්කේ නිර්ධන පංතිය බලයට පැමිණ සියලු වරප්‍රසාද අහෝසි කළ විට පමණි. ජාතික ප්‍රශ්නය නිර්ධන පංති නායකත්වයකින් තොරව විසඳිය නොහැකි බව මෙයින් පැහැදිළි වනු ඇත.' (විජේවීර මෙම වාර්තාවේ එක් තැනක 'කෲර මර්දනය විසින් අහිංසක දෙමළ ජනතාව දෙමළ ඊළම වෙත තල්ලු කෙරේ' යනුවෙන් සඳහන් කරයි)

වර්තමානයේ කලාපීය දේශපාලනය තුළ ජවිපෙ වෙත විශ්මය ජනක ලෙස වාසිදායක වන මතවාදී තර්ක පවතී. ඒවා 1986 විජේවීර ඉදිරිපත් කළ වාර්තාව තුළ ද දැකගත හැකිය.

නැගෙනහිර කැඳ අලෙවිසලක දී හමු වූ කලකිරීමට පත් මුස්ලිම් තරුණයකුගෙන් සහ කඳුකරයේ දෙමළ ජාතිකයන් වෙසෙන නගරවල දී කෙරුණු සංවාදවලින් පමණක් මෙම තොරතුරු ලබා ගත නොහැකිය. මෙය වර්තමාන යථාර්ථයයි. තාප්ප මත ලියූ අකුරු ඇත. ඒවා රතු පාටය. ■

21 වන පිටෙන්

## බන්දුන් සමුළුව හරහා.......

ඉදිරියට යන්නේ කෙසේද කියන එක තමයි අද නොබැඳි ව්‍යාපාරයට තිබෙන ප්‍රශ්නෙ. එය ලේසි පහසු ප්‍රශ්නයක් නෙමෙයි. නව අධිරාජ්‍යවාදීන් තමන්ට ඕන විදිහට කටයුතු කරනව. කොටින්ම කියනව නම් අද ඇමෙරිකාවෙ පරමාර්ථය තමයි ලෝකය තමන්ට ඕන විදිහට පාලනය කිරීම. මේ පරමාර්ථයට එරෙහිවන සතුරාට කල්තබා පහර දී විනාශ කිරීම ඔවුන්ගේ දර්ශනය වෙලා තියෙනව. මේ හමුවේ යළි නැඟී සිටින්නේ කොහොමද කියන එක නොබැඳි ව්‍යාපාරයට තියෙන බරපතල ප්‍රශ්නයක්. මෙය ලේසියෙන් පහසුවෙන් කරන්න පුළුවන් දෙයක් නෙමෙයි.

අනික් අතට අද ලෝකයේ ආර්ථික බලතුලනය දැඩි ලෙස වැඩිවෙලා තියෙනව. දියුණු හා දුප්පත් රටවල් අතර පරතරය සීඝ්‍රයෙන් ඉහළ යමින් තියෙනව. 1960දි 30ට 1ක් වෙච්ච දියුණු හා දුප්පත් රටවල් අතර අනුපාතය 90දි 60ට 1ක් 94 දි 74ට 1ක් වශයෙන් වැඩිවෙලා තියෙනව. මේ තත්වය අවම කරගන්න ඕන. ඒ සඳහා ලෝක වෙළඳ සංවිධානය වගේ විවිධ සංවිධාන සමඟ ගිවිසුම්වලට යන්න ඕන. එහෙම නැතුව ඔවුන්ගෙ ආර්ථිකය නගා සිටුවන්න බැහැ. මෙය නොබැඳි ව්‍යාපාරයට තියෙන තවත් බරපතල ප්‍රශ්නයක්.

ඒ වගේම නොබැඳි ව්‍යාපාරයට සම්බන්ධ රටවලට අද වෙනකොට තියෙන බරපතල ප්‍රශ්නයක් තමයි ඒ ඒ රටවල තියෙන ප්‍රශ්න නිසා වගේම බටහිර බලවතුන්ගේ උවමනාවන් නිසා මතුවෙලා තියෙන ත්‍රස්තවාදය. එය මැඩ පැවැත්වීම සඳහා සාමූහික ප්‍රයත්නයක් අවශ්‍ය වෙනව.

අවසාන වශයෙන් පැහැදිළි වන දේ තමයි අද ලෝකයේ නොදියුණු රටවල්වලට තවත් විදිහකට කියනව නම් නොබැඳි ව්‍යාපාරයට සම්බන්ධ වෙලා ඉන්න රටවල්වලට එකතු වෙලා දිනාගත යුතු ප්‍රශ්න රාශියක් තිබෙන බව. ඒ සඳහා නව බලයකින් යළි නැඟී සිටිය යුතුයි. මේ සඳහා පසුගිය දා පැවති බන්දුන් සමුළුවෙන් යම් ආරම්භයක් ලබාගත්තා යැයි කියල සිතාගන්න පුළුවන්. එහෙත් එය සාර්ථක කරගන්න එක ලේසි පහසු කටයුත්තක් නෙමෙයි. කොහොම වුණත් එය සාර්ථක කරගත්තොත් ලෝකයටම යහපතක් බව නම් කියන්න පුළුවන්.

මොහාන් සමරනායක

■